# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ජාතික තරගකාරී ලංසුකරණය (NCB)

## හෝමාගම, පිටිපන, තලගල පාර, මාහේනවත්ත, අදිරය - 1 ගොඩනැගිල්ල ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් (SLIBTEC) සඳහා රසායනාගාර උපකරණ සැපයීම, ස්ථාපනය, නඩත්තු කිරීම සහ ක්‍රියාත්මක කරවීම සඳහා ප්‍රසම්පාදනය

**කොන්ත්‍රාත් අංකය : SLIBTEC/PROC/326/NCB/G&S Procurement of Laboratory Equipment Supply, Installation Maintenance and Commissioning**

01. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් (SLIBTEC) හි දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් හෝමාගම, පිටිපන, තලගල පාර, මාහේනවත්ත, අදියර - 1 ගොඩනැගිල්ල, SLIBTEC සඳහා රසායනාගාර උපකරණ සැපයීම, ස්ථාපනය, නඩත්තු කිරීම සහ ක්‍රියාත්මක කරවීම සඳහා ප්‍රසම්පාදනය සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, සුදුසුකම් නිර්ණායකයන් හි දැක්වෙන පරිදි අදාළ ක්ෂේත්‍රයේ ව්‍යාපාර ලියාපදිංචියක් ලබා සිටිය යුතුය.

03. මේ සඳහා උනන්දුවක් දක්වන වන ලංසුකරුවන්ට 2026 ජූනි 14 වන දින සිට 2026 ජූනි 28 වන දින දක්වා SLIBTEC වෙබ් අඩවියෙන් (**https://www.slibtec.gov.lk/procurement**) ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද ලංසු ලිපි ලේඛන සම්පූර්ණ කට්ටලයක් බාගත කරගත හැකිය. පූර්ව ලංසු රැස්වීමක් 2026 ජූනි 16 වන දින පෙ.ව. 9.30ට ඉහත සඳහන් ලිපිනයේදී පැවැත්වේ.

04. ආපසු ගෙවනු නොලබන ලංකා රුපියල් 20,000.00ක ගාස්තුවක් මහජන බැංකුවේ හෝමාගම ශාඛාවේ ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් නමින් පවත්වාගෙන යනු ලබන අංක 049-1-001-7-0067474 දරන ගිණුමට බැර කළ යුතුය. (සැලකිය යුතුය. බැංකු තැන්පතු පත්‍රිකාවේ තැන්පත්කරුගේ විස්තර හා තැන්පත් කිරීමේ පරමාර්ථය ලෙස **"ආපසු ගෙවනු නොලබන ටෙන්ඩර් ගාස්තු"** යනුවෙන් සඳහන් කළ යුතුය. ඉහත කී මුදල් තැන්පතු පත්‍රිකාවේ මුල් පිටපත ලංසු සමග ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. ගෙවීම් මුදලින් බැංකුවට සිදුකළ යුතු අතර, අනෙකුත් ගෙවීම් ක්‍රම සඳහා අවසර නොමැත.)

05. ලංසු පිටපත් දෙකකින් යුතුව, 2026 ජූනි 30 වන දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් (SLIBTEC) අදියර 1 ගොඩනැගිල්ල, මාහේනවත්ත, තලගල පාර, පිටිපන, හෝමාගම යන ලිපිනයට ගෙනවිත් භාරදිය යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් ලංසු විවෘත කරනු ලැබේ.

06. ලංසු විවෘත කිරීමේ දිනයේ සිට දින 91ක් සඳහා ලංසු වලංගු විය යුතු අතර, ලංසු සමග ලංකා රුපියල් 710,000.00 ක වටිනාකමින් යුත් ලංසු සුරක්ෂණයක් අමුණා එවිය යුතුය. ලංසු සුරක්ෂණය ලංසු වලංගු කාලයේ සිට දින 28 ක් ඉදිරියට එනම් 2026 ඔක්තෝබර් 27 වන දින දක්වා වලංගු විය යුතුය

07. ගෙනවිත් භාරදීමේ කාලය, ප්‍රදානය කරන ලද දිනයේ සිට සති 7ක් ඇතුළත විය යුතුය.

08. ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය මගින් ලංසුකරණය මෙහෙයවේ.

09. සුදුසුකම් අවශ්‍යතා ලංසු ලිපි ලේඛනයෙහි ඇතුළත් කොට ඇත.

10. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් (SLIBTEC) සහ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය පලනය යටතේ ඇති ඕනෑම අනෙකුත් ආයතනයක සේවකයකු සමග සමීප පවුල් ඥාති සම්බන්ධතාවයක් ඇති සේවකයකු හෝ ආයතනයක් හා / හෝ පුද්ගලයකු ලංසු තැබීමේ ක්‍රියාවලිය සඳහා **සුදුසුකම් නොලබයි.**

11. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු **tharindu.madushankha@slibtec.gov.lk** විද්‍යුත් තැපැල් ලිපිනය හරහා ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ්, ප්‍රසම්පාදන කළමනාකරු වෙතින් ලබාගත හැක.

**සභාපතිනි,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ්** (SLIBTEC).
**2026 ජූනි 14 වෙනි දින.**